# ජන කතා පරිශීලනයෙන් නව නිර්මාණ බිහි කිරීම

ඔබ ජනකතා බොහෝමයක් කියවා ඇත. නැතිනම් වැඩිහිටියන්ගෙන් අසා ඇත. ජන කතා පිළිබඳ මීට පෙර පාඩම් කිහිපයකම කතා කර ඇත. ආදී ජනයාගේ දේශීය විදේශීය සිරිත් විරිත්, ඇදහිලි විශ්වාස, ඇඳුම් පැළඳුම් , ආහාර පාන, රැකී රක්ෂා විවිධ සන්නිවේදන ක්‍රම ආදි සිද්ධි සමග ජනකතා බැදී ඇත. මෙකී ජනකතා ආශ්‍රිතව ඔබට නව නිර්මාණ බිහි කළ හැක. විවිධ නිර්මාණයන් කිරීමට උචිත අවස්ථා, ජනකතා හොදින් අධ්‍යනය කිරීම මගින් හදුනාගත හැක.

- රජවරු සම්බන්ධ කතා - කැකිල්ලේ රජ්ජුරුවන් ගැන කතා
- ගමරාළ හා ගොවි ජීවිතය ගැන කතා - හීල බත් දංකුඩ
- යෝධයන් හා වීර පුරුෂයන් ගැන කතා - බුලතා යෝධයා, නන්දමිත්‍ර යෝධයා
- අන්දරේ හා වෙනත් විකට චරිත ගැන කතා - මහදැන මුත්තයි ගෝලයෝ රොත්තයි
- ප්‍රස්ථා පිරුළු ආශ්‍රිත කතා - අබරා සිල් ගත්තා වගේ
- ඉතිහාස කතා - රාවණා රජුගේ යුධ කතා

ආදී වශයෙන් ජනකතා බොහෝමයක් පවතී.

මුඛ පරම්පරා ගතව පැවත එන මෙම කතාවන් සමාජීය වෙනස්කම් සමග වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. ඔබ මේවා අධ්‍යනය කළ යුතුය.ඒ සඳහා ඔබට හමුවන ඕනෑම ජන කතාවක් කියවිය යුතුය . අප රටේ පමණක් නොව, විදේශීය ජනකතා ද එක්රැස් කිරීම හා ඒවා කියවා අවබෝධයක් ලබා ගත යුතුය. ඊට අමතරව ඔබ කියවන ජනකතාවලින් කියවෙන යටිපෙළ අරුත ගැන ද විමසිලිමත් විය යුතුය. එමෙන්ම නව අර්ථයක් සහිතව ජනකතාව ප්‍රති නිර්මාණය කිරීමට හැකි විය යුතුය. ඒ මගින් තත්කාලීන ගැටලු විසඳීමට ද උපක්‍රමශීලී විය යුතුය.

ජනකතා එක්රැස් කිරීම මගින්,

- රසවත් තොරතුරු හෙළිවීම.
- සාහිත්‍ය පෝෂණය.
- විවිධ අංශ පිළිබඳ විශාල දැනුමක් ලැබීම.
- නොදන්නා තොරතුරු රැසක් ලබා ගැනීමට හැකිවීම.

ආදී ප්‍රයෝජන රැසක් හිමි වේ.

ජනකතා හොඳින් අධ්‍යනය කළ යුතුය. එසේ අධ්‍යනය කරන ලද ජන කතාවන් හී ආවේණික භාෂා ශෛලින් හඳුනාගෙන එය සමාජයට ගලපමින් සමාජ ගැටලුවලට ප්‍රතිකර්ම ඇතුළත් වන සේ නව නිර්මාණයන් බිහිකිරීම වැදගත් වේ.

පැවරුම් -

- ජනකතා ඔස්සේ නැගුණු වේදිකා නාට්‍ය නරඹන්න.
- ඔබ සිත් ගත් ජනකතාවක් කෙටියෙන් ලියන්න.



